# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2181/12 - 2020 ජුනි මස 23 වැනි අඟහරුවාදා - 2020.06.23

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, එකී මණ්ඩලයට ගාල්ල නාගරික සීමා අපජල ප්‍රතිචක්‍රියකරණ ව්‍යාපෘතිය යටතේ අපජල පවිත්‍රාගාරය ඉදිකිරීම සඳහා ඉඩම් කොටසක් අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ නිශ්චල දේපල අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 ජුනි මස 08 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ දී ය.

5-2/GL/05.

### *උපලේඛනය*

ගාල්ල දිස්ත්‍රික්කයේ ගාල්ල-කඩවත්සතර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 103A, ගිංතොට නැගෙනහිර ග්‍රාම නිලධාරී වසමේ දඩැල්ල ගමේ පිහිටි ගාල්ල දිස්ත්‍රික් ජ්‍යෙෂ්ඨ මිනින්දෝරු අධිකාරී විසින් සකස් කරන ලද අංක GA/GFG/2016/313 දරන ප්‍රගමන අනුරේඛනයේ කැබලි අක්ෂර C ලෙස දැක්වෙන ප්‍රමාණයෙන් හෙක්. 0.1604 (රූඩ්. 01, පර්. 23.43) ක් පමණ වූ කනත්ත නොහොත් කනත්තවත්ත සහ දෙනියකනත්ත නම් වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

| | | |
|---|---|---|
| *උතුරට* | : | මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B සහ ඩබ්. ෂෙල්ටන් යන තවත් අය හිමිකම් කියනු ලබන ඇටඹගහවත්ත ; |
| *නැගෙනහිරට* | : | ඩබ්. ෂෙල්ටන් සහ තවත් අය හිමිකම් කියනු ලබන ඇටඹගහවත්ත සහ මාර්ගය ; |
| *දකුණට* | : | මාර්ගය සහ මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B ; |
| *බටහිරට* | : | මෙම අනුරේඛනයේ කැබලි අක්ෂර B ; |



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම සහ ලිපිනය* : 01. පී. එච්. රූපරත්න මයා./පී. එච්. තරංගා මධුෂානි මිය, අංක 42/07, බෝපේ පාර, ගිංතොට.

02. පී. එච්. නන්දනී මිය/පී. එච්. තිලකරත්න මයා, අංක 42/07, බොපේ පාර, ගිංතොට

07 - 237

---

**1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනත**

92 වැනි වගන්තිය යටතේ නියමය

1974 අංක 02 දරන ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩල පනතේ 92 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය, මහින්ද රාජපක්ෂ වන මම, එකී මණ්ඩලයට මාගාල්ල III අදියර ජල සම්පාදන ක්‍රමය යටතේ ජල තටාකය හා පොම්පාගාර ඉඩමට ප්‍රවේශ මාර්ගය හා නල එලීම සඳහා ඉඩම් කොටසක පරවශතාව අත්කර ගැනීමට අවශ්‍ය වී ඇති හෙයින්, මෙහි පහත උපලේඛනයෙහි දැක්වෙන ඉඩම් කොටසේ පරවශතා අයිතිය අත්කර ගැනීම මේ නියමයෙන් අනුමත කරමි.

**මහින්ද රාජපක්ෂ,**
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍ය.

2020 ජුනි මස 08 වැනි දින,
අංක 35, ලක්දිය මැදුර,
නව පාර්ලිමේන්තු පාර,
පැලවත්ත, බත්තරමුල්ල,
නාගරික සංවර්ධන, ජල සම්පාදන හා නිවාස පහසුකම් අමාත්‍යාංශයේ දී ය.

5-2/GL/02.

***උපලේඛනය***

ගාල්ල දිස්ත්‍රික්කයේ ඉමදුව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 154B, පොල්හේන ග්‍රාම නිළධාරී වසමේ අඟුළුගහ ගමේ පිහිටි කළුපහනවත්ත *නොහොත්* කළුපනවත්ත නැමති පර්චස් 10ක් පමණ වූ පහත සඳහන් මායිම් තුළ වූ ඉඩම් කොටස.

*උතුරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;

*නැගෙනහිරට* : පවත්නා ප්‍රවේශ මාර්ග කොටස ;

*දකුණට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;

*බටහිරට* : මෙම ඉඩමේ ඉතිරි කොටස ;

*ඉඩමට හිමිකම් කියන්නන්ගේ නම සහ ලිපිනය* : 01. පී. එච්. චන්ද්‍රසිරි මහතා,
දෙනියවත්ත,
අඟුළුගහ.

07 - 242

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.